

# පළාත් පාලන ඡන්දයේ සැඟවුණ යථාර්ථය

පළාත් පාලන ඡන්දයේ ප්‍රතිඵල ජුලි 24 උදෑසන ප්‍රකාශයට පත්විය. වෙනදා මෙන්ම කිසිදු වෙනසක් සිදු නොවිණි. ආණ්ඩුව නැවත ජයගත් බවත් 'රියල් ස්ටාර්' තරගයේ සුපිරි තරුව ජනාධිපතිවරයා බවත් නැවත කියන ලදි. පළාත් පාලන ආයතන 65 න් 45 එක්සත් ජනතා නිදහස් සංධානයත්, දෙමළ ජාතික සන්ධානය ආයතන 18 ක් ද, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ආසන 02 ක් ද, දිනාගන්නා ලදි. විශේෂත්වය එ.ජා.ප.ට කිසිදු ආයතනයක හෝ බලය හිමි නොවීමය. මැතිවරණ ප්‍රතිඵල මේ ආකාරයේ වුවත් අපට රටක් ලෙස සතුටු විය හැකි සැබෑ ජයග්‍රහණයක් ලැබී තිබේද යන බව විමසා බැලිය යුතුව තිබේ.

## ඡන්දය දිනවා ස්වයං රැවටීම

උතුරේ ඡන්ද ප්‍රතිඵලයේ ඇති සැලකිලිමත් විය යුතු විශේෂ ලක්‍ෂණයක් වන්නේ දෙමළ ජාතික සංධානය ලබා ඇති ජයග්‍රහණයයි. දෙමළ ජාතික සංධානයේ ජයග්‍රහණය පසුපස ඇත්තේ දෙමළ ජාතිවාදී සටන් පාඨවල ජයග්‍රහණයකි. දෙමළ ජාතික සංධානය වත්මන් මැතිවරණයෙන්ද ඉදිරිගාමී ජයග්‍රහණයක් ලැබීමට සමත්වීම පෙන්වා දෙන්නේ ආණ්ඩුව බෙදුම්වාදී ජාතිවාදයේ සන්නද්ධ පෙරමුණ පරාජය කොට ජයලබා ඇතත් ජාතිවාදය පරදවා ජනතාවගේ හදවත් දිනාගන්නට අසමත්ව ඇති බවයි. මේ පිළබඳ යාපනයේ ප්‍රකට විද්වතෙකු 2011 ජුලි 26 දින ලංකාදීප පුවත්පතට දුන් සම්මුඛ සාකච්ඡාවේදී වඩා නිවැරදිව දක්වා තිබුණි. ඔහු 1996-2004 යාපනය විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස වාර දෙකක්ම කටයුතු කළ මහාචාර්ය බාලසුන්දරම් වල්ලෙයි මහතාය. ''දිගුකාලීන යුද්ධයකට හා ආර්ථික අවපීනයකට ලක්ව සිටි උතුරේ ජනතාවට සහන දීමේදී ඔවුන්ගේ මානසිකත්වය තේරුම් ගෙන කටයුතු කළ යුතුව ඇත. භෞතික සංවර්ධනයක් සිදුවන බව පෙනුනත් ජනතාව තවමත් බියෙන් හා සැකයෙන් ජීවත් වේ. ප්‍රජාතන්ත්‍රවාදී අතිවාසිකම්, වරප්‍රසාද භුක්තිවිදීමේ දී මෙම ජනතාව තවමත් පසුවන්නේ පසුගාමී තත්වයකයි. ඊට හේතුව ඔවුන්ගේ ජීවිතයේ නොවිසදුණු ප්‍රශ්න රාශියක් තවමත් ගොඩගැසී තිබීමයි.''

ඉහත උපටාගැනීම ඔහුගේම වචනවලින් ලබාදුන් සම්මුඛ සාකච්ඡාවෙනි. යාපනයේ සැබෑ තත්වය විනිවිද දකින මෙම මහාචාර්යවරයා එම ක්ෂේත්‍රය දැන හදුනාගෙන විසදුම් සෙවිය යුතු බවට යෝජනා කරයි. එහෙත් යාපනයේ සත්‍ය වශයෙන් සිදුවන්නේ කුමක් ද? යාපනයේ ජනතාවගේ ජන විඥාණය හදුනාගෙන ඊට අනුකූලව කටයුතු කිරීම සිදුනොවන බවට නිදසුන් රැසක් දැක්විය හැකිය.

## යාපනයේ සැබෑ තත්වය

මතුපිට සිදුවීම් කිහිපයක් සැලකූ විට ප්‍රශ්න ඔඩු දුවා ඇති ආකාරය පිළිබඳ අදහසක් ලබාගත හැකිය. පසුගිය දිනක යාපනයේ පැවති පර්යේෂණ සහකාර පුරප්පාඩු 100 ක් සඳහා අයදුම්පත් කැඳවා තිබුණි. ඊට සුදුසුකම් සපිරූ අයදුම්කරුවන් 1100 ක් ඉල්ලුම්කර තිබුණි. මෙය එහි පවතින රැකියා අර්බුදයට සාක්ෂියකි.
සාපේක්ෂව යාපනය නගරය ආශ්‍රිතව යම් ආර්ථික සංවර්ධනයක් ඇතත් ඉන් ඈතට යත්ම තත්වය එතරම් යහපත් නොවේ. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව දකුණේ ජනතාවගේ ඒක පුද්ගල ආදායම ඇමරිකන් ඩොලර් 4000 සීමාවේ පවති. එහෙත් උතුරු පළාතේ ජනතාවගේ ඒක පුද්ගල ආදායම ඩොලර් 1310 කි.

මේ වනවිටත් විවිධ ස්ථානවල රඳවා සිටින දෙමළ සිරකරුවන් සංඛ්‍යාව 4700-5200 අතර වේ. උතුරු පළාතේ රැකියා විරහිත උපාධිධාරීන් 4500 පමණ සිටී. ස්වේච්ඡා ගුරුවරුන් 700 ක් පමණ වේ. මේ අනුව විදේශ ආධාර මත ්9 මාර්ගය කාපට් කර ඇතත් ජනතාවගේ සැබෑ ගැටලු විසදීමේ අවශ්‍යතාවයක් හෝ ප්‍රවේශයක් රාජපක්ෂ ආණ්ඩුවට නොමැති බව දිනෙන් දින පැහැදිලි වේ.

## හමුදා පාලනය දිගටම

උතුර බඔඔෘ යෙන් නිදහස් කරගත් පසු සිවිල් පරිපාලනය ඉතා ඉක්මනින් තහවුරු කළ යුතුව තිබේ. එහෙත් සිදුකරමින් ඇත්තේ ඊට සපුරාම ප්‍රතිපක්ෂ ක්‍රියාමාර්ගයකි. එහි ජනතාව කෙරේ ආරක්ෂක අංශවල බලපෑම කොතෙක් ද යත් දෛනික ජීවිතයේ පෞද්ගලික කටයුත්තක් වුවද ආරක්ෂක අංශවල අවසරයෙන් තොරව සිදුකළ නොහැකි මට්ටමට වැටී තිබේ.
තිදෙනෙකුට වඩා ඒකරාශී වන අවස්ථාවක් තිබේනම් දැනුම් දී තිබිය යුතුය. එලෙස කළයුතු බවට විධානයක් පනවා ඇත. එපමණක් නොව එවිට හමුදාව ද එම අවස්ථාවට සහභාගී වේ. පොතක් ප්‍රකාශයට පත්කළේ නම් ඒ පිළිබඳ සියලු විස්තර ලබාදිය යුතු අතර බුද්ධි අංශවල අනේකවිධ ප්‍රශ්න වලටද උත්තර දිය යුතුව තිබේ. පසුගිය ජුනි 30 දා කොළඹ මහත්මා ගාන්ධි කේන්ද්‍රයේ ' මහත්මා ගාන්ධි අනුස්මණ ' දේශනය පවත්වන ලදි. එහි තේමාව වූයේ රට ගොඩනැගීම සඳහා විද්වතුන්ගේ කාර්යභාරය යන්නයි. එය සිදුකළේ යාපනය සරසවියේ ආචාර්යවරයෙක් විසිනි. එහිදී දේශනය ආරම්භයේදීම ඔහු කියාසිටියේ ඔබට මෙම දේශනය කොළඹ දී නිසා ඇසිය හැකි වුවත් යාපනයේදී නම් හමුදාව මේ සඳහා අවසර ලබානොදෙනු ඇති බවයි. තත්වය එවැනි එකකි.

## ඡන්දයේ රංගසෝබාව

පළාත් පලාත් ඡන්දය සාධාරණව හා සාමකාමීව පැවැත්වූ බව නිරතුරු මාධ්‍යවලින් පැවසුවද එහි ඇති සත්‍යතාවය ඡන්දය ආසන්න කාලයේ යාපනයේ තත්වය හා සිදුවීම් ඇසුරෙන් විමසා බැලිය යුතුය. පොදුවේ හමුදා බලය යොදාගෙන ඡන්ද ව්‍යාපාරය සිදුකළ අතර එහි සම්පූර්ණ වාසිය ආණ්ඩුව තමන් සතු කරගත්තේය. ජුලි 22 උදේ 8.30 පමණ හමුදා නිලධාරීන් හතර දෙනෙකු පැමිණ රාමන-ාදන්පුරම්ති ජම්බුකොලම්හදී ග්‍රාමනිලධාරීන්ට ගමේ ඡන්ද කාඩ් එකතු කරදෙන ලෙස දන්-වාගොස් තිබුණි. එසේම 22 රාත්‍රියේදී පච්චලෙයි පල්ලි ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ හමුදා නිල ඇදුම්ව සහ සිවිල් ඇදුමින් පැමිණි පිරිසක් ජනතාවගේ හැදුනුම්පත් හා ඡන්ද කාඩ් එකතු කර තිබුණි. එම ප්‍රදේශයේම ග්‍රාමනිලධාරී වසම් 20 ක ඡන්ද කාඩ් එකතුකරගෙන ගොස් තිබුණි. මෙවැනි සිදුවීම් රැසකි.

අමතරව දේශීය හා ජාත්‍යන්තර ජනමාධ්‍ය ඔස්සේ ද ප්‍රචාරයට ලක්වූ තවත් සිදුවීමක් වූයේ දෙමළ ජාතික සංධානයයේ සී. සිවකුමාර් මහතාගේ ගෙදර බල්ලා මරා දමා උගේ හිස ගේට්ටුවේ ගසා තැබීමේ සිදුවීමයි. තවත් ආධාර කරුවකුගේ නිවස ඉදිරිපිට මල් වඩම් තබාගොස් තිබුණි. පාර්ලිමේන්තු මන්ත්‍රී සිවාජිලිංගම් මහතාගේ දේශපාලන කාර්යාලයට පහර දී තිබූ අතර, ආධාර කරුව-න් ගණනාවක නිවාසවලට අසුචි ගසා තිබුණි. ජනතා විමුක්ති පෙරමුණේ කිලිනොච්චි ධර්මපුරම් කණ්ඩායම් නායකයාට මැතිවරණ කටයුතු නවතා දමන ලෙස තර්ජනය කර තිබුණි. වෙනකක් තබා ආණ්ඩුවේ අපේක්ෂකයන්ගේ පෝස්ටර් ඇලවීම ද , අනෙක් දේශපාලන පක්ෂවල පෝස්ටර් ගැලවීම සිදුකළේ හමුදාව යොදාගනිමිනි.
මේ මැතිවරණයට අදාලව සිදුවීම් කීපයක් පමණි. එහෙත් එය යාපනයේ ඡන්දය සිදුකළ අයුරු පිළිබඳ අදහසක් ලබාගැනීමට ප්‍රමාණවත්ය. මෙලෙස බලහත්කාරයෙන් උතුරේ ඡන්ද දිනමින් යාපනය හමුදාකරණය කරමින් , දෙමළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් අහිමි කරමින් යන අතරතුර , ඉන්දියානු මැදිහත්වීම් ද තීව්‍ර වෙමින් තිබේ.

## ඉන්දියානු අතපෙවීම්

ඉන්දියානු ක්‍රියාකලාපය කෙතරම් සූක්ෂම ආකා-ාරයෙන් සිදුකෙරේද යත් ආර්ථික, දේශපාලන හා සමාජීය යන සෑම ක්ෂේත්‍රයක් පුරාම එම බලපෑම තීව්‍ර කෙරෙමින් පවතී. මෙහි වඩා වැදගත් කරුණ වන්නේ උතුරේ සහ දකුණේ ද ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උදුරා ගනිමින් සිටින අතර ඉන්දීය ආර්ථික අවශ්‍යතාවය හමුවේ සියලු සම්පත් රිදී බන්දේසියක තබා පූජා කරමින් තිබීමයි.
විවිධ ආර්ථික කටයුතු සඳහා ඉන්දියානු සමාගම් සියයකට අධික ප්‍රමාණයක් මෙහි පැමිණ තිබේ. බලශක්ති ක්ෂේත්‍රය සඳහා ඉන්දීය බලපෑම් තීව්‍ර ලෙස සිදු කෙරෙමින් පවතී. චීන වරායේ ඇති තෙල් ටැංකි 35 ගිවිසුමකින් තොරව ඉන්දියානු තෙල් සමාගම වෙත :ෂධක*බදු දුන් අතර , රට පුරා තිබුණ ඉන්ධන බෙදාහැරීමේ ජාලයෙන් 60% ද ෂධක මේ වන විට පවරා දී තිබේ.

විදුලි බල ක්ෂේත්‍රය ගත්විට ඉන්දියාවෙන් මෙගාවෝට් 1000 ක ධාරිතාවයෙන් යුත් විදුලි රැහැනක් ඇද උතුරට විදුලිය ලබාගැනීම ඇතුලු විවිධ කටයුතු රැසක් සිදුකෙරෙමින් තිබේ. ත්‍රිකුණාමලය සාම්පූර්හි මෙගාවෝට් 500 ක තාපබලාගාරයක් ඉදිවෙමින් පවති. ඉහත දක්වා ඇත්තේ බලශක්ති ක්ෂේත්‍රය සඳහා වන ඉන්දියානු මැදිහත්වීම් පමණි. සිය ස්වාභාවික සම්පත ප්‍රවාහනය ආදී විවිධ ක්ෂේත්‍ර රැසක් කරා පැතිර ගිය එකකි.

2010 සැප්තැම්බර් මස අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මගින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කර 577 ක භූමි භාගය පවරාගෙන ඇත. මෙය ඉන්දියානු සමාගමකට ලබාදීමට නියමිතය.

## තර්ටීන් ප්ලස්

මේ සියලු කටයුතු සිදුකෙරෙමින් පවතින අතර රාජපක්ෂ රෙජීමය දකුණේ මෙන්ම උතුරේ ජනතාවට ද අතරමං කරමින් ඇත. 2011 ජුලි 29 ඩේලි මිරර් පුවත්පත සමඟ සම්මුඛ සාකච්ඡාවකදී බැසිල් රාජපක්ෂ ඇමතිවරයා අපූරු අදහසක් ඉදිරිපත් කර ඇත. පලාත් පාලන මැතිවරණයේදී දකුණේ ඡන්ද බහුතරය තමන්ට ලැබී ඇත්තේ බලය බෙදීම ජනතාව ප්‍රතික්ෂේප කරන නිසා යැයි පවසා ඇත. ඒ අතර දෙමළ ජාතික සංධානය ඊට පෙර දින මාධ්‍ය නිවේදනයක් මගින් කියා සිටියේ උතුරේ තමන්ට දකුණේ ආණ්ඩුවට වඩා බහුතර ඡන්ද ලැබී තිබීමෙන් ප්‍රකාශය පත්වන්නේ උතුරේ ජනතාව තුළ වෙනම පාලනයක් සඳහා ඇති කැමැත්ත තවමත් නොසිදී පවතින බවයි ද යනුවෙන් දක්වා ඇත.
ගැලරිය පිනවීමට මෙසේ කතා කරන අතරතුර ඉන්දීය බලපෑම හමුවේ දේශපාලන විසදුමකට යන බවද මීට පෙර කියා තිබුණි. පසුගිය ජුනි 10 ඉන්දීය විදේශ ලේකම් නිරූපමා රාඕ ඇතුලු දූත පිරිසක් පැමිණ සාකච්ඡා කර ආපසු ගියේය. ඉන්පසු කැබිනට් ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල ප්‍රකාශ කර සිටියේ උතුරේ ප්‍රශ්නයට විසදුමක් ලෙස ආණ්ඩුව 13 ටත් එහා යාමට සූදානම් බවයි. එහෙත් දකුණේ ජාතිවාදය තුළ පෝෂණය කරමින් ආ මනෝභායට එය එතරම් ගොචර නොවන නිසා පසුව එහි එහි 'සැර බාල 'කරන ලදි. ඉන්පසු ජනාධිපතිවරයා සිදුකළේ අනෙක් පක්ෂ කරපිට මෙම ප්‍රශ්නය දමනු සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිළිබඳ යෝජනාව ගෙන ඒමයි. එහෙත් මෙය එලකට නැති දෙයක් බවට අමතර සාධක උවමනා නොවේ. මීට පෙර තිස්ස විතාරණ සර්ව පාක්ෂික කමිටු යෝජනා පිළිබද පමණක් සලකා බැලීම ප්‍රමාණවත්ය.

මෙහි ඇති සැබෑ ප්‍රශ්නය කුමක්ද? ආණ්ඩුවට උතුරේ දෙමළ ජනතාවගේ මෙන්ම දකුණේ සිංහල ජනතාවගේ ද ප්‍රශ්න විසදීමේ සැබෑ අරමුණක් නොවේ. අනිත් අතට කල්ලිවාදී කල්ලිවාදී දේශපාලනයේ හා ආත්මාර්ථයේ ගිලුණු නායකයන-'ට ඒ වෙනුවෙන් අවශ්‍යතාවය තිබුණ ද කළ හැකි කිසිවක් ඇත්තේ ද නැත. මිනිසා ජාතිවාදය වැනි සරල සටන් පාඨ ඔස්සේ ජනතාව පෙළ ගැස්වීමට කටයුතු කරයි. මෙවැනි පාලක කල්ලියකට ජනතාව වෙත සාධාරණත්වය හා සමානාත්මතාවය ගෙන ආ නොහැක. එහෙන් දකුණ පමණක් නොව උතුර ද ජාතිවාදයට ගමන් කරමින් තිබේ. ඒ අතරතුර ඉන්දියාව ඉන්දියාව සිය ආර්ථික අවශ්‍යතා උදෙසා දෙමළ ජනතාවගේ ප්‍රශ්නය උපයෝගී කරගනිමින් සිටී. උතුරේ දෙමළ ජාතික සන්ධානය ද උතුරේ ජනතාව ජාතිවාදය හරහා තමන් වෙතට ලංකරගැනීමේ උත්සාහයක නිරතව සිටී.

ක්‍රමක්‍රමයෙන් ලාංකීය සමාජය භයානක ගිනි කන්ද-ක් මතට පියමං කරමින් සිටී. මෙය කෙළවර විය හැක්කේ සමාජ ව්‍යසනයකිනි. ඊට පෙර වහාම කර්තව්‍යයක් වේ. ඒ උතුරේ මෙන්ම දකුණේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් තහවුරු කිරීමයි. සමානාත්මතා පදනම සියලු ජාතීන් සමඟ කටයුතු කිරීමයි.

ජනතා විමුක්ති පෙරමුණ
මෙල්බන් ශාඛාව

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ කේක් සැරසිලි උපදේශිකාවක්
වෙතින් මෙල්බර්න් නුවර ඔබටත් දැන් විශේෂ සේවාවක්



මංගල කේක්, උපන්දින කේක්, ෂෝට් ඊට්ස්
වර්ග ඇතුළු ඕනෑම උත්සව අවස්ථාවක් විමසන්න
ඉරෝෂා සේනානායක
Ph: 03 5996 4304
Mob: 0433 455 596





No. 08, Miralie Way, Cranbourne West